ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2428/72 - 2025 මාර්තු මස 23 වැනි ඉරිදා - 2025.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025

2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 3 වන වගන්තිය යටතේ වූ නියමය

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) විධිවිධාන ප්‍රකාරව ලිඛිත නීතියක් යටතේ පිහිටුවා ඇති සෑම මහා නගර සභාවකටම, නගර සභාවකටම සහ ප්‍රාදේශීය සභාවකටම සහිකයන් තෝරා පත්කර ගැනීම පිණිස 2025.05.06 දින පවත්වනු ලබන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා තරග කරන සෑම පිළිගත් දේශපාලන පක්ෂයකටම, ස්වාධීන කණ්ඩායමකටම හා අපේක්ෂකයකුටම 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව එකී ඡන්ද විමසීමේ දී තරග කරනු ලබන එක් එක් පළාත් පාලන ආයතනයේ එක් එක් ඡන්ද කොට්ඨාසයේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැය කළයුතු වියදම් සීමා මෙකී පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සමග සාකච්ඡා කර, විමසීමෙන් අනතුරුව මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලදුව මෙහි උපලේඛනයේ සඳහන් කොට ඇත.

ආර්.එම්.ඒ.එල්. රත්නායක,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එම්.ඒ.පී.සී. පෙරේරා,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

අමීර් හායිස්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

ඒ. ෂන්මුගනාදන්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2025 මාර්තු මස 23 වැනි දින,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.